www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උත්තේජනයේ සිට පටි තද කිරීම කරා: ජාත්‍යන්තර පන්ති යුද්ධ පිලිවෙතක්

## From stimulus to austerity: An international class-war policy

2010 ජුලි 22

පසු ගිය මාස කිහිපයේ දී ජාත්‍යන්තර ධනේශ්වරය සිය සාමාජීය පිලිවෙත තව දුරටත් දකුනට මාරු කිරීමක් දිස් විය. එනම්, ආර්ථික උත්තේජන පිලිවෙත්වල සිට දරුනු පටි තද කිරීමේ පියවරයන් කරා හැරී ගැනීමකි. සියලු ප්‍රධාන ධනපති රටවල පාලක පන්ති අයවැය හිඟය අඩු කිරීමේ නාමයෙන් කම්කරු පන්තියේ අතීත සාමාජීය ජයග්‍රහන මත ඍජු ප්‍රහාරයක් එල්ල කරමින් සිටී.

මෙම පිලිවෙත්වල දිගු කාලීන එල්ලය ඉන්දියාව සහ චීනය බඳු නැගී එමින් පවතින ආර්ථිකයන්හි දිලිඳු කම්කරුවන්ගේ මට්ටමට තම රටවල කම්කරුවන්ගේ ජීවන තත්ත්වයන් ද තලා දමා වඩා පැරනි ධනපති බලවතුන්ගේ තරගකාරිත්වය යලි ස්ථාපනය කර සුභසාධන රාජ්‍යය මුලිනුපුටා දැමීම යි. ලෝක මහජනතාවගේ ජීවන තත්ත්වයන් උඩු අතට නො ව යටි අතට සම කෙරෙන්නට යාම ධනපති ක්‍රමයට දෝෂාභියෝගයකි.

බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන් සඳුදා පැවැත්වූ "මහා සමාජයක්" පිලිබඳ කතාව මෙම මාරුව නිදර්ශනය කරයි. එය කම්කරු පන්තියේ දරිද්‍රතාව ඩිකන්සියානු [චාර්ල්ස් ඩිකන්ස් විසින් ඔහුගේ තර්කවල විස්තර කල, 19 සියවසේ එංගලන්ත කම්කරු පන්තියේ දරිද්‍ර කොන්දේසි - පරිවර්තක] තත්ත්වයන් කරා ආපසු ගෙන යාම අරමුනු කර ගත් ප්‍රතිපත්ති ප්‍රකාශයකි.

තම සැලසුමේ දරුනු ඉඟි වසං කිරීමට උත්සාහ කරමින් කැමරන් සිය "මහා සමාජය" විස්තර කලේ මහජනයා "බලගන්වන" සහ "විමුක්ත කරන" "දැවැන්ත සංස්කෘතික පෙරලියක්" ලෙස ය. ආන්ඩුවෙන් පවත්වා ගෙන යන සමාජ සේවාවන් පෞද්ගලීකරනය කර එම සේවාවන්හි හරය වනසා එය ඉටු කර ගන්නා බව කියැවෙයි.

බැංකු බේරා ගැනීම සඳහා ජාතික භාන්ඩාගාර කොල්ල කෑම කේන්ද්‍ර කර ගත්, කම්කරු පන්තියට කිසිදු ඉතා සැලකිය යුතු සහනයක් නොසැලසූ 2008-2009 උත්තේජන පිලිවෙතින් වර්තමාන පටි තද කිරීමේ වැඩ සටහන් කරා මාරු වීම යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යුරෝව බේරා ගැනීම සඳහා මැයි මාසයේ දී බිලියන 750ක අරමුදලක් නිවේදනය කිරීම සමග සම්පාත විය. අරමුදල පිහිටුවූයේ ග්‍රීසිය, පෘතුගාලය සහ ස්පාඤ්ඤය නය ගෙවීම පැහැර හැරීම සහ යුරෝව පිරිහීම වලකනු වස් ය.

එය නියෝජනය කරන්නේ රජයේ අරමුදල් සුවිසල් බැංකු කරා මාරු කිරීමේ තවත් දැවැන්ත පියවරකි. පිම්කෝ නමැති සුරැකුම් පත් ආයෝජන සමාගමේ මොහොමඩ් අල්-ඒරියාන් කී පරිදි: "පෞද්ගලික ආයෝජකයන්ට සොඳුරු ලීලාවෙන් නික්ම යාමට ඉඩ හදා දෙමින් පෞද්ගලික අංශය දැරූ වගකීම් භාර ගැනීමට යුරෝපා මහ බැංකුව, යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරහා රාජ්‍ය අංශය සිය ශේෂ පත්‍රය අතැතිව මැදිහත්ව සිටී."

බැංකුවල අයකරගත නොහැකි නයෙන් නිදහස්වීම සඳහා යන වියදම සාමාජීය වැඩ සටහන්, රැකියා, වැටුප් සහ විශ්‍රාම වැටුප් කෲර ලෙස කපා හැරීමේ ස්වරූපයෙන් කම්කරු පන්තිය දරනු ඇතැයි අරමුදල පිහිටුවන විට ප්‍රධාන යුරෝපා ආන්ඩු එකඟ විය. "ප්‍රකෘතිමත් වීම" නොකඩවා පවත්වා ගෙන යාමට කෙරුනු උත්තේජනකාරී කතාබහ "රාජ්‍ය ආදායම ශක්තිමත් කිරීමට" කෙරුනු සාර්වත්‍රික ඉල්ලීමෙන් අත හැර දැමින, හිලව් කෙරින.

මෙම මාරුව නිවේදනය කෙරුනේ ජූනි මස පලමු සතියේ ටොරොන්ටෝවේ පැවැත්වුනු ජී-20 මූල්‍ය ඇමතිවරුන්ගේ රැස්වීමේ දී ය, මාසය අග දී පැවැත්වුනු ජී-20 සමුලු රැස්වීමේ දී නිල වශයෙන් පිලිගැනින.

සිය පන්ති පිලිවෙත තීන්දු කිරීමේ දී ග්‍රීසියේ අත්දැකීමෙන් ධනේශ්වරය නිර්භය විය. ග්‍රීසියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පැස්නැක් (PASNAK) ආන්ඩුව දැවැන්ත මහජන විරෝධයක් හමුවේ පටි තද කිරීමේ වැඩ පිලිවෙලවල් මාලාවක් ක්‍රියාවට දැමීමට සමත් වී ඇත.

ග්‍රීසියේ දී, එක් දින සංකේත වර්ජන සහ විරෝධතා මාර්ගයෙන් කම්කරු පන්තියේ ප්‍රතිරෝධය සීමා කර ගැනීමට සහ විසුරුවා හැරීමට පාලක පන්තිය වෘත්තීය සමිති කෙරෙහි විශ්වාසය තබා ඇත. සාමාජීය කප්පාදුවලට එරෙහි මහජන විරුද්ධත්වය සමිතිවලට යටත් කල යුතු බව අවධාරනය කරන ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය සහ සිරිසා වැනි සුලු ධනේශ්වර "වාම" සංවිධානවල මාර්ගයෙන් වෘත්තීය සමිති නිලධරය තීරනාත්මක සහායක් සපයා ඇත.

පෘතුගාලයෙහි සහ ස්පාඤ්ඤයෙහි අත්දැකීම් එක සමාන ය. සමිති තවත් දැවැන්ත කම්කරු පන්ති

විරෝධයක් යටපත් කල පසුව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු එක ම කට්ටලයක සාමාජීය කප්පාදු, සේවකයන් දොට්ට දැමීම් සහ වැටුප් කප්පාදු නිවේදනය කර ඇත.

ආර්ථික සහ සාමාජීය පිලිවෙතෙහි මාරුවට අනුරූපව ජාත්‍යන්තර ආතති පිලිබිඹු කරන දේශපාලනික වෙනස් වීම් මාලාවක් සිදු වී ඇත. කැමරන් නායකත්වය දෙන කොන්සර්වටිව්-ලිබරල් ඩිමොක්‍රැටික් සන්ධාන ආන්ඩුවක් මැයි මාසයේ දී බ්‍රිතාන්‍යය තුල පිහිටුවනු ලැබින.

ජූනි මස මුල ජී-20 මූල්‍ය ඇමතිවරුන්ගේ රැස්වීම පැවැත්වුනු සතියේ දී ම ජපාන අගමැති යුකිඕ හටොයාමා ඉල්ලා අස් වී තනතුරට පත් නඕටෝ කාන් සංගත බද්ද සියයට 40 සිට සියයට 25 දක්වා කපා හැර සියයට 5 අලෙවි බද්ද දෙගුන කල පටි තද කිරීමේ වැඩ සටහනක් වහා ම නිවේදනය කලේ ය.

ජූනි මස අග දී, ලේබර් පක්ෂ තන්ත්‍රය තුල සිදු වුනු කුමන්ත්‍රනයකින් ඕස්ට්‍රේලියානු අගමැති කෙවින් රැඩ් බලයෙන් පහ වී ජූලියා ගිලාඩ් තනතුරට පත් විය. ඇෆ්ඝනිස්ථානයෙහි එක්සත් ජනපද ආක්‍රමනකාරී වාඩි ලා ගැනීමට ඕස්ට්‍රේලියාව බැඳී සිටින බව යලි තහවුරු කල ගිලාඩ් ඕස්ට්‍රේලියානු පතල් කර්මාන්ත සමාගම්වලට පැනවීමට යෝජිත බද්ද වහා ම ඉවත දමා පටි තද කිරීමේ පිලිවෙත්වලට හැරී ගන්නා බව නිවේදනය කලා ය.

යුරෝපයෙහි බටහිර පිහිටි අයර්ලන්තයෙහි පටන් නැගෙනහිර යුරෝපය සහ රුසියාව දක්වා පුලුල් අයවැය කප්පාදු වැඩ සටහන් නිවේදනය වී ඇත. ආර්ථික වශයෙන් බලගතු ම යුරෝපා රාජ්‍යය වන ජර්මනිය යුරෝ බිලියන 80ක කප්පාදුවක් පටවමින් සිටී. ප්‍රන්සය පුලුල් විශ්‍රාම වැටුප් කප්පාදු ද ප්‍රාන්ත ආන්ඩු අයවැයවල සියයට 10ක කප්පාදුවක් ද නිවේදනය කර ඇත.

යුරෝව බේරා ගැනීමේ බිලියන 750 අරමුදල සහ එහි මිල කම්කරු පන්තිය ලවා ගෙවා ගැනීමට පටි තද කිරීමේ වැඩ සටහන් දියත් කිරීම, අඩු ගනනේ දැනට යුරෝපා ධනේශ්වරයේ ආත්ම විශ්වාසය යලි පන ගන්වා ඇත. 2010 මුල් මාස හයේ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 15කින් පහත වැටුනු යුරෝව පසු ගිය මාස දෙකේ දී ප්‍රබල ලෙස ආ පස්සට පැන ඇත. ඩොලර් 1.30 හාත්පස ගැවසෙමින් එය ලද පාඩුවෙන් සියයට 10ක් පිරිමසා ගෙන ඇත.

ඔබාමා පාලනාධිකාරය යුරෝපා පටි තද කිරීමේ පිලිවෙත් ක්‍රියාත්මක කෙරුනු කාලය සහ වේගය ගැන යුරෝපය සමග ගැටෙතත් එය ද උත්තේජනයේ සිට අයවැය හිඟය කැපීම කරා ඒ හා සමාන අයුරින් මාරු වී ඇත. එය ජනපදවලට අලුත් ෆෙඩරල් ආධාර ලබා දීම සඳහා වැදගැම්මකට නැති යෝජනා ඉදිරිපත් කිරීම සඳහට ම අත් හැර දමා ඇත. දිගු කාලීන විරැකියන්ට වැඩි කල ෆෙඩරල් විරැකියා දීමනා ලබා දීම සති ගනනක් පමා කිරීම ඔවුන් මුලුමනින් ම කම්මුතු කර දැමීමේ සූදානම යි.

පාලනාධිකාරය සහ කොන්ග්‍රසය තුල සිටින ඩිමොක්‍රැටික් නායකත්වය, අතිරික්ත කොට රැකියාවලින් නෙරපුනු කම්කරුවන් කිසිදු ආදායමක් නැති තැනට ඇද දැමීමට අවශ්‍ය මහජන මතය හදා ගැනීමට විරැකියා දීමනා "රැකියාවක් කිරීම අධෛර්ය කරන්නක්" සහ අලුත් හිමිකමක් ලෙස විස්තර කරමින් ඒ පිලිබඳ "විවාදයකට" නිහඬව අනුබල දෙමින් සිටී.

එක්සත් ජනපදයෙහිත් ජාත්‍යන්තරවත් දරිද්‍ර වැටුප් සහ කුරිරු වැඩ වේගවත් කිරීම පිලිගැනීමට කම්කරුවන්ට බල කිරීමට මහා විරැකියාව යොදා ගනු ලැබේ.

ජාත්‍යන්තර ධනේශ්වරය කම්කරු පන්තියට එරෙහි සිය යුද්ධය තීව්‍ර කිරීමට ඉහල සවිඤ්ඤානකතාවකින් පෙරට යමින් සිටී. කම්කරු පන්තියේ ප්‍රතිරෝධය සිර කිරීමට වෘත්තීය සමිති සපයන තීරනාත්මක සේවාව පිලිබඳව එය ඉතා හොඳින් දැනුවත් ය. බෙට්න්කෝට් සෝලිය ගැන මෑත දී පැවැත්වූ රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රන්ස ජනාධිපති නිකොලස් සර්කොසි ආර්ථික අර්බුදයේ දී ඉටු කල "හාරදූර" භූමිකාව ගැන වෘත්තීය සමිතිවලට ප්‍රශංසා කිරීමේ අවශ්‍යතාව අවධාරනය කලේ ය.

ග්‍රීසියෙහි කොමියුනිස්ට් පක්ෂය සහ සිරිසා, ප්‍රන්සයෙහි කොමියුනිස්ට් පක්ෂය සහ නව ධනපති-විරෝධී පක්ෂය, ජර්මනියෙහි වාම පක්ෂය, බ්‍රිතාන්‍යයෙහි සමාජවාදී කම්කරු පක්ෂය සහ එක්සත් ජනපදයෙහි ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය වැනි නානාප්‍රකාර සුලු ධනේශ්වර ව්‍යාජ-වාමවාදී සංවිධාන ඉටු කල තීරනාත්මක දේශපාලන භූමිකාව පිලිබඳව ද පාලක පන්තිය මැනවින් දැනුවත් ය.

මෙම සංවිධානවල කේන්ද්‍රීය උත්සුකතාව නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන්, එනම් "ලේබර් පක්ෂයෙන්" සහ වෘත්තීය සමිති නිලධරයෙන් පිටස්තරව සහ වමට යමින් කම්කරු පන්තිය අරගලයට පිවිසීමේ අන්තරාය යි. අන් සියල්ලට මත් වඩා එවැනි වර්ධනයක් වැලැක්වීමට ඔවුන් අධිෂ්ඨාන සහගත ය.

කම්කරු පන්තිය ධනේශ්වරයේ මෙම ද්‍රෝහී ඒජන්සිවල ප්‍රතිගාමී ග්‍රහනයෙන් මිදීමට උත්සාහ කරන බවට සමාජවාදී සමානතා පක්ෂය අපේක්ෂා සහගතව සිටී. එවැනි බිඳීමක් ඇති කිරීමටත් බලය ගැනීම සඳහා සහ බංකොලොත් ධනපති ක්‍රමය අවසන් කිරීම සඳහා කම්කරු පන්තියේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීමටත් අපි නිශ්චිතව ම සටන් වදිමු.

බැරී ග්‍රේ

© www.wsws.org